# මගේ පුංචි කුඩේ



කතෘ :- යශෝදරා ඒකනායක

**කෘතියේ නම** - "මගේ පුංචි කුඩේ"

**කතෘගේ නම** - යශෝදරා ඒකනායක

**කතෘගේ වෙනත් කෘති** - "යාළු සමනළී" (2019)

**කෘතිය පළ කරන දිනය** - 2023 . 11 . 15

**ISBN No** : ISBN 978-624-206-583-0

**Barcode No** : 9 786242 065830

# පිදුම

හොඳ දේ කියා දෙමින්

උදව් උපකාර කරමින්

හැමවිටම මට ශක්තිය දෙන

මගේ ආදරණීය දෙමව්පියන්ට හා අයියාට

සහ

ගුරුතුමන් හා ගුරුතුමියන් හට

ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

මට තියෙනවා ලස්සන පාට පාට කුඩයක්.





මේ දවස්වල වැස්ස නිසා ඒක මට ගෙනත් දුන්නේ මගේ අම්මා.

මම ඒකට හරිම ආසයි. මම ඒක පාවිච්චි කරන්නේ හරිම පරිස්සමින්.



හැම වෙලාවෙම මගේ කුඩේ දලා තියෙන්නේ මම ඉස්කෝලේ ගෙනියන පොත් බෑග් එකේ.

එක දවසක් බෑග් එකෙන් පොතක් ගන්න යනකොට සිංදු කියන හඬක් ඇහුණා. වටපිට බලනකොට කව්රුත් නෑ.



ඒ එක්කම මම දැක්කා මගේ බෑග් එකත් ඒ තාලෙටම හෙලවෙනවා. සද්දේ එන්නෙත් බෑග් එක ඇතුළෙන්ම කියලා මට තේරුණා.

ළඟපාත කව්රුත් හිටියේ නැති නිසා මට බයකුත් දැනුණා.

ඒත්...මට උවමනා වුණා බෑග් එක ඇරලා බලන්න.

එකවරම ලංවෙලා බෑග් එක ඇරලා මම අහකට පැන්නා.

එතකොටම "බය වෙන්න එපා. මම ඔයාගේ යාළුවා. ඔයා මාව ආදරෙන් බලාගන්න නිසා මම ඉන්නේ හරිම සතුටින්. ඒ නිසා මම සිංදු කියලා නටනවා. ඔයාව මම අව්වෙන් වැස්සෙන් හැමදාම රකින්නම්. එන්න ඔයත් මගෙත් එක්ක එකතු වෙලා නටන්න" කියලා එලියට පැන්න කුඩේ කියාගෙන කියාගෙන ගියා.

මට හරිම පුදුමයි. ඒ වගේම සතුටුයි. මමත් කුඩේ එක්ක සිංදු කියලා නටන්න පටන් ගත්තා.



“මැණිකේ…” එක පාරටම ඇහුණ අම්මගේ හඬින් මම කලබල වුණා. වටපිට බලද්දී මම හිටියේ ඇඳේ, අම්මා ළඟ. ටික වේලාවක් යනකොට මට තේරුණා සිදුවුණ දේ.



අපි ප්‍රයෝජනයට ගන්න දේවල් හොඳින් පාවිච්චි කරනවනම්, හොඳින් ආරක්ෂා කරනවනම් ඒවා හැමදාමත් අපිට ගොඩක් උදව්වෙනවා කියලා හීනෙන් ඇවිල්ලා මට කියලා දුන්න මගේ ලස්සන පුංචි කුඩේ අරගෙන පපුවට තුරුල් කරගෙන මම ආයෙමත් නින්දට ගියා.



-

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයිපාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමි . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01